කාර්යසාධන වාර්තාව

2025

ශීර්ෂය - 102

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය: 102

01 පරිච්ඡේදය	-	ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය	....	03
02 පරිච්ඡේදය	-	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	....	09
03 පරිච්ඡේදය	-	2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය	....	12
04 පරිච්ඡේදය	-	කාර්යසාධන දර්ශක	....	19
05 පරිච්ඡේදය	-	තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	....	20
06 පරිච්ඡේදය	-	මානව සම්පත් පැතිකඩ	....	23
07 පරිච්ඡේදය	-	අනුකූලතා වාර්තාව	....	26

පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ශ්‍රී ලංකාවේ ප්‍රධානතම කැබිනට් අමාත්‍යාංශයකි. එමඟින් රටේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම තහවුරු කරනු වස් ආයෝජනය සහ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම උදෙසා රටෙහි ආර්ථික සහ මූල්‍ය ප්‍රතිපත්ති නිර්මාණය, යෝජනා කිරීම සහ ඇගයීම ප්‍රධානම වශයෙන් සිදු කෙරේ.

මේ වන විට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා ලෙස කටයුතු කරන අතර ඒ යටතේ නියෝජ්‍ය අමාත්‍යවරු දෙදෙනෙකු ද, භාණ්ඩාගාර ලේකම්වරයා සහ නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරු තිදෙනෙකු ද, කටයුතු කරනු ලැබේ.

1.2 අමාත්‍යාංශයේ ආරම්භය

1947 වසරේ නිදහස ලැබීමෙන් අනතුරුව, අග්‍රාමාත්‍යවරයා විසින් මුදල් අමාත්‍යවරයෙකු පත් කරමින් මුදල් හා භාණ්ඩාගාර අමාත්‍යාංශය ස්ථාපිත කරන ලදී. රටේ මූල්‍ය කටයුතු කළමනාකරණය කිරීමට අමතරව, නව රජයේ පරිපාලන ව්‍යුහය ගොඩනැගීමේදී ද, මෙම අමාත්‍යාංශය ප්‍රධාන භූමිකාවක් ඉටු කරන ලදි. 1950 දශකයේදී රජයේ ආදායම්වල ප්‍රධාන මූලාශ්‍රය වූයේ බදු ආදායම වන අතර, විශේෂයෙන්ම අපනයන හා ආනයන සම්බන්ධ බදු එහි විශාල කොටසක් වූයේ රට බාහිර වෙළඳාම මත දැඩිව රඳා සිටි බව ප්‍රකාශ කරමිනි. ආදායම් බදු දෙපාර්තමේන්තුව, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, රජයේ මුද්‍රණාලය සහ ජාතික ගබඩා වැනි ප්‍රධාන දෙපාර්තමේන්තු කිහිපයක්ද මෙම අමාත්‍යාංශයේ පාලනය යටතේ පැවතුණි.

1948 දී, මධ්‍යම බැංකුවක් ස්ථාපිත කිරීම සඳහා සිලෝන් රජය ඇමරිකා එක්සත් ජනපදයෙන් තාක්ෂණික සහාය ඉල්ලා සිටියේය. ඇමරිකානු ආර්ථික විද්‍යාඥ ජෝන් එක්ස්ටර්ගේ නිර්දේශ මත 1949 දී සිලෝන් මධ්‍යම බැංකුව ස්ථාපිත කරනු ලැබූ අතර, සිලෝන් රුපියල රටේ ප්‍රමිත මූල්‍ය ඒකකය ලෙස නම් කරන ලදී. 1950 දී සිලෝන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) හි සාමාජිකත්වය ලබා ගනිමින්, ගෝලීය මූල්‍ය සහයෝගීතාවය හා මූල්‍ය ස්ථායීතාවය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කළ ආසියානු රටවල් කිහිපය අතරට එක්වෙමින්, තම ආර්ථික තත්ත්වය තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කරන ලදි.

1.3 අමාත්‍යාංශයේ විෂය පථය

සාර්ව ආර්ථික ප්‍රතිපත්ති, වාර්ෂික අයවැය සහ විසර්ජන පනත්, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, දේශීය හා විදේශීය ඉතුරුම් සහ ආයෝජන, රාජ්‍ය ණය, බැංකු, මූල්‍ය සහ රක්ෂණ ක්‍රියාකාරකම්, ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාවය සහ සමාජ ආරක්ෂණ සහ ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් මෙහෙයවීම සම්බන්ධයෙන් වගකීම.

1.4 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම :

"කඩිනම් සංවර්ධනය සහ ආයෝජනය සඳහා පහසුකම් සලසන ආර්ථික පසුබිමක් තුළින් නව ශ්‍රී ලංකාවක්"

මෙහෙවර :

"මහජනතාවට උසස් ජීවන තත්ත්වයක් ලබාදෙන බවට සහතික වීම පිණිස ආයෝජනය සහ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම උදෙසා කාර්යක්ෂම ලෙස හා විනිවිද භාවයෙන් යුක්තව රටේ ආර්ථික හා මූල්‍ය ප්‍රතිපත්ති නිර්මාණය කිරීම, යෝජනා කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම."

අරමුණු :

- රටේ ජාතික ආර්ථික හා මූල්‍ය ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීම.
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ සාර්ව මූල්‍ය ප්‍රතිපත්ති කළමනාකරණය.
- ජාතික සංවර්ධන සැලසුම් නිර්ණය කිරීම, වාර්ෂික අයවැය සකස් කිරීම හා මූල්‍ය සම්පත් කළමනාකරණය.
- ජාතික බදු ප්‍රතිපත්තිය කළමනාකරණය හා රාජ්‍ය ආදායම ඵලදායී ලෙස භාවිතා කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව හා සම්බන්ධීකරණය කරමින් මූල්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම.
- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම හා ආර්ථික සංවර්ධනය සඳහා පෞද්ගලික අංශයට පහසුකම් සැලසීම.
- ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය සිදුකිරීම හා ඵලදායී භාවිතය තහවුරු කරමින් විදේශ සම්පත් සංචලිකරණය.
- ඒකාබද්ධ අරමුදල පවත්වාගෙන යාම හා ඒ සඳහා ගිණුම්ගත කිරීම හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව රටේ වාර්ෂික ගිණුම් ප්‍රකාශයට පත් කිරීම.

1.5 ප්‍රධාන කාර්යයන්

- මූල්‍ය හා බදු ගණනය විෂයයට සම්බන්ධ දෙපාර්තමේන්තු ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා යටතට ගැනෙන එකී විෂයන්හි ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කිරීම අධීක්ෂණය සහ ඇගයීම.
- සාර්ව මූල්‍ය කළමනාකරණ හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම.
- මූල්‍ය සම්පත් කළමනාකරණය සහ වාර්ෂික අයවැය පිළියෙල කිරීම.
- අයවැය පිළිබඳ මූල්‍ය පාලනය බලාත්මක කිරීම සහ ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම.
- රජයේ ආදායම් ඵලදායී ලෙස භාවිතා කිරීම සහ ජාතික බදු ප්‍රතිපත්ති කළමනාකරණය කිරීම.
- රජයේ මූල්‍ය රෙගුලාසි බලාත්මක කිරීම.

- ඒකාබද්ධ අරමුදල කළමනාකරණය.
- රාජ්‍ය වියදම් කළමනාකරණය.
- රජයේ ප්‍රසම්පාදන උපදේශාත්මක සේවා.
- දෙපාර්තමේන්තු සහ අනෙකුත් රාජ්‍ය මුදල් පාලනය කිරීම.
- රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වාර්තා මත පදනම් වූ භාණ්ඩාගාර රැස්වීම් වාර්තා පවත්වාගෙන යාම.
- දෙපාර්තමේන්තු වල කළමනාකරණ විගණනය උසස් කිරිම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම.
- සේවක සංඛ්‍යා කළමනාකරණය.
- ආයතන වලට පවරන ලද අනෙකුත් සියලුම විෂයයන්ට සම්බන්ධ කරුණු.
- ආයතන අධීක්ෂණය.
- අභියාචනා ක්‍රියාපටිපාටිය සකස් කිරීම සඳහා බදු අභියාචනා කොමිෂන් සභාවේ නීති රීති සැකසීමට පියවර ගැනීම.
- බදු අභියාචනා සාධාරණ හා අපක්ෂපාතීව විභාග කිරීමේ වඩාත් කාර්යක්ෂමව හා ඵලදායි ක්‍රමයක් සැපයීම සඳහා මෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පනවන ලද නීති සහ පිළිගත් ක්‍රියාපාටිවලට අනුකූලව යම් බද්දක්, ගාස්තුවක්, අයකිරීමක්, පැනවීමක් හෝ දණ්ඩනයක් සම්බන්ධයෙන් ලැබුණු සියළුම අභියාචනා අවසන් කිරීමේ පැවරී ඇති වගකීම ඉටු කිරීම.

1.6 සංවිධාන සටහන


Secretary to the treasury
Deputy Secretary to the
Deputy Secretary to the
Deputy Secretary to the
Deputy Secretary to the
Treasury Departments
Treasury Departments
Addl.Sec (SLAS)
ADG (SLAS) (Parliamentary Affairs)
ADG (SLAS) (Administration)
DG (SLAS) (Corporate Affairs)
CFO (SLAcS)
DG (SLPS)
CFO (SLACS) (Internal Audit Division)
SAS (Par.Aff) (SLAS)
Director (Building) (SLEgS)
SAS (Admin) (SLAS)
SAS (Admin) (SLAS)
Director (SLAS)
Director (Admin/Co.A) (SLPS)
ADG (SLAS)
ADG (SLAS)
ADG (SLPS)
ADG (SLAcS)
Director (SLAS)
Director (SLAS)
Director (SLPS)
Director (SLAcS)
Director (SLAcS)
CA (SLAcS)
CIA (SLAcS)
CIA (SLAcS)
AS (SLAS)
AD (SLPS-S/N)
Engineer Building (SLEgS)
AD (Transport) (SLPS-S/N)
AS (SLAS)
AS (SLAS)
AS (SLAS)
DD (SLAS)
DD (SLAS)
AD/DD (SLAcS)
Acc (SLAcS)
Acc (SLAcS)
Acc (SLAcS)
IA (SLAcS)
IA (SLAcS)
AD (SLPS S/N)
Media Unit
AO Postal
AO Admin
Translator 03
DO 03
DO 01
DO 01
DO 03
DO 14
DO 04
DO 01
News Editor
TO 01
BMO 01
MSO 04
MSO 07
MSO 05
MSO 01
MSO 05
MSO 32
MSO 09
MSO 18
MSO 01
MSO 08
MA 01
TrO 01
TrO 01
FDO 01
Cameraman 02
Drivers 49
Lighting Assistant 1
TA 01
KKS 04
KKS 08
KKS 02
KKS 02
KKS 04
KKS 38
KKS 06
KKS 05
KKS 01
KKS 03

1.7 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

2024.11.25 සිට මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ඇතුළත් දෙපාර්තමේන්තු.

01	මහා භාණ්ඩාගාරය
02	ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව
03	විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
04	ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
05	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
06	ජාතික අයවැය දෙපාර්තමේන්තුව
07	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
08	රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
09	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
10	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
11	වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
12	නීති කටයුතු දෙපාර්තමේන්තුව
13	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
14	සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව
15	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
16	කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය
17	ණය කළමනාකරණ දෙපාර්තමේන්තුව
18	තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තෙමේන්තුව
19	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
20	ශ්‍රී ලංකා රේගුව
21	සුරාබදු දෙපාර්තමේන්තුව
22	තක්සේරු දෙපාර්තමේන්තුව
23	ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
24	ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

1.8 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන/අරමුදල්

2024.11.25 සිට මේ දක්වා මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇතුළත් ආයතන

01	ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL)
02	ලංකා බැංකුව (BOC)
03	මහජන බැංකුව (PB)
04	ජාතික ඉතිරිකිරීමේ බැංකුව (NSB)
05	ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC)
06	ජාතික ලොතරැයි මණ්ඩලය (NLB)
07	සංවර්ධන ලොතරැයි මණ්ඩලය (DLB)
08	නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව (HDFC)
09	රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (SMIB)
10	ණය තොරතුරු කාර්යාංශය (CRIB)
11	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB)
12	ජාතික රක්ෂණ භාර අරමුදල (NITF)
13	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL)
14	රාජ්‍ය සේවා අන්‍යොන්‍යාධාර අර්ථසාධක සංගමය (PSMPA)
15	ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය (SLAASMB)
16	ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා පාලිත අනුබද්ධ ආයතන (SLIC)
17	ලිට්රෝ ගෑස් ලංකා ලිමිටඩ් (LGLL)
18	සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය (ETF)
19	තිරසාර සංවර්ධන සභාව (SDC)
20	ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව (PUCSL)
21	ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (IPS)
22	රජයේ නිලධාරින්ගේ යහසාධක සංගමය (GOBA)
23	ලංකා ලුණු සමාගම (LSL)
24	සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය (WBB)
25	ලෝහෝර් ආර්යා ණය අරමුදල (LLLF)
26	ජාතික ණය සුරකුම් ආයතනය (NCGL)
27	ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI)

1.8 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන/අරමුදල්

2024.11.25 සිට මේ දක්වා මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇතුළත් ආයතන

28	**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව (SEC)**
29	රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව
30	කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව
31	ටෙක්නෝ පාක් ඩිවලොප්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්
32	හොටෙල් ඩිවලපර්ස් (ලංකා) පෞද්ගලික සමාගම
33	කැන්විල් හෝල්ඩිංග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
34	ප්‍රොවිඩන්ට් ප්‍රොපර්ටි ලංකා ලිමිටඩ්
35	සුදු ක්‍රීඩා නියාමන අධිකාරිය
36	කොළඹ වරාය නගරය සංවර්ධන ව්‍යාපෘතිය
37	ව්‍යාපෘති - Revenue Administration Management Information System (RAMIS) - Integrated Treasury Management Information System (ITMIS) - Revenue Administration System For Excise Department (RASID) - Trade National Single Window System Project (TNSWSP) - Social Protection Project (SPP) - E – Procurement (EGP)

1.9 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

අනු අංකය	(අ) ව්‍යාපෘතියේ නම	(ආ) දායක නියෝජිතායතනය	(ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම (රු. මි.)	ව්‍යාපෘති කාල සීමාව
01	සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය (SPP)	ලෝක බැංකුව	ඇමෙරිකන් ඩොලර් මිලියන 200	අවුරුදු 03 (2024 සිට 2027.9.30 දක්වා)
02	මූල්‍ය ක්ෂේත්‍ර ආරක්ෂිත ජාලය	ලෝක බැංකුව	ඇමෙරිකන් ඩොලර් මිලියන 150	අවුරුදු 03 (2024 සිට 2027.12.31 දක්වා)

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

- විශේෂ ජයග්‍රහණ, අභියෝග

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2025 වසර සඳහා අයවැය යෝජනා 54 ක් ඉදිරිපත් කර ඇති අතර එම යෝජනා අතර ප්‍රාග්ධන යෝජනා 44 ක් ද, මූලධන යෝජනා 10 ක් ද, ඇතුළත්ය.. 2025 වසර අවසන් වනවිට මෙම යෝජනා 54 න් 85 % ක මූල්‍ය ප්‍රගතියක් ළඟා කරගෙන ඇති අතර යෝජනා කිහිපයක් ක්‍රියාත්මක වෙමින් පවතී. අතර, යෝජනා වලින් 12 %ක් ක්‍රියාත්මක කළ යුතු තත්ත්වයේ පවතී.

ආර්ථිකයේ සියලුම අංශවල ශක්තිමත් වර්ධනය හේතුවෙන්, 2025 වසරේ පළමු භාගය තුළ දී, ආර්ථිකය සියයට 4.8 කින් වර්ධනය වී ඇති අතර. උද්ධමනය මේ වනවිට නැවත ධන අගයකට පැමිණ ඇත. භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකය අඩුවීමෙන් මූලය අංශය ස්ථාවර වී තිබෙන අතර විනිමය අනුපාතිකය ද, ස්ථාවර වී ඇත. ගෝලීය කම්පනයන් මධ්‍යයේ පවා ආනයන අපනයන ඇතුලත් විදේශ අංශය ශක්තිමත් වූවා සේම අපනයන, සංචාරක සහ විදේශ ප්‍රේෂණ ගලා ඒම ඉහළ යාම හේතුවෙන්, දළ නිල සංචිත ප්‍රමාණය ඇගමරිකානු ඩොලර් බිලියන 6 ඉක්මවීය. 2006 වසරේ සිට ආසන්න වශයෙන් දශක දෙකකට පසු රාජ්‍ය අංශයේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 16 ක මට්ටමට ලඟා වීමට 2026 වසරේ දී හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමෙන්ම 2026 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයන් සියයට 2.3 ක වූ ඉලක්කගත අගය කැපී පෙනෙන ලෙස ඉක්මවා යන, ඉතිහාසයේ ඉහළම ප්‍රාථමික අතිරික්තයක් වාර්තා කිරීමට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකාව 2022 වසරේ ආර්ථික අර්බුදයෙන් තවමත් යථා තත්ත්වයට පත්වෙමින් සිටී. 2023 වර්ෂයේ ආරම්භයේදී උද්ගත වූ විදේශ විනිමය අර්බුදය නිසා ඇති වූ අභියෝගාත්මක තත්වය 2024 වර්ෂයේදී මැඩපවත්වමින් දුෂ්කරතා හැකිතාක් අවම කරගනිමින් ජන ජීවිත සාමාන්‍ය පරිදි පවත්වා ගැනීමට හැකිවන පරිදි ආර්ථිකය මෙහෙයවීම අප අමාත්‍යාංශය ක්‍රියා කළ අතර 2024 සිට 2025 දක්වා කාලය ගැඹුරු ආර්ථික අර්බුදයකින් ප්‍රතිසාධනය හා ස්ථායීකරණය වෙත ගමන් කළ පරිවර්තන අවධියක් ලෙස සැලකේ. මෙම කාලය තුළ ප්‍රධාන අවධානය යොමු වූයේ IMF ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම යටතේ මහා ආර්ථික ස්ථායීකරණය සහ ආර්ථික ප්‍රතිසාධනය වෙතය. 2024 සිට 2025 දක්වා ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය, එම කාලය තුළ ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයි.

2024 වර්ෂයේ සහ 2025 වර්ෂයේ දී හඳුන්වා දුන් ආදායම් උපායමාර්ග තුලින් බදු පරිපාලනය ශක්තිමත් කිරීම, අනුකූලතාව වැඩිදියුණු කිරීම, වැඩිදියුණු කළ ඩිජිටල්කරණය සහ දැඩි අධීක්ෂණ යාන්ත්‍රණ හරහා ආයතනික ශක්තිය වැඩිදියුණු කිරීම මගින් රාජ්‍ය මූලය තිරසාරභාවය වැඩි දියුණු කිරීමට කටයුතු සලසා ඇත. එසේම, මෙම බදු පරිපාලනය සහ බදු අනුකූලතා වැඩිදියුණු කිරීමේ පියවරයන් හේතුකොටගෙන 2025 වර්ෂයේ දී ශ්‍රී ලංකාවට ආදායම් ඉලක්කයක් ජය ගැනීමට හැකි විය.

- **2025 වසරේ සුවිශේෂී ආර්ථික ජයග්‍රහණ:**

- අපගේ ආර්ථික වර්ධනය 2024 වසරේ පළමු භාගය තුළ පැවති සියයට 4.6 සිට 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 4.8 දක්වා වැඩි වීම.
- විරැකියාව 2024 වසරේ පළමු කාර්තුවේ පැවති සියයට 4.5 ක සිට 2025 වසරේ පළමු කාර්තුවේ දී සියයට 3.8 දක්වා පහත වැටුණා. 2024 වසරේ මුල් මාස නවය හා සසඳන විට, 2025 වසරේ මුල් මාස නවය තුළ අපගේ භාණ්ඩ අපනයනය ඇමරිකානු ඩොලර් බිලියන 8.5 සිට ඇමරිකානු ඩොලර් බිලියන 9.1 දක්වා වැඩි විය.

- ශ්‍රමික ප්‍රේෂණ ඇමරිකානු ඩොලර් බිලියන 4.8 සිට ඇමරිකානු ඩොලර් බිලියන 5.8 දක්වා වැඩි විය.
- සංචාරක ඉපැයීම් ඇමරිකානු ඩොලර් බිලියන 2.3 සිට ඇමරිකානු ඩොලර් බිලියන 2.5 දක්වා වැඩි වූ අතර ආදායම් සහ ප්‍රදාන රුපියල් ට්‍රිලියන 2.9 සිට රුපියල් ට්‍රිලියන 3.8 දක්වා වැඩි වී ඇත.
- ප්‍රාථමික ශේෂය රුපියල් ට්‍රිලියන 0.8 සිට රුපියල් ට්‍රිලියන 1.5 දක්වා තියුණු ලෙස වැඩි වූ අතර 2025 වසරේ සැප්තැම්බර් වන විට ප්‍රාග්ධන වෙළඳපොළේ කාර්යසාධනය 2024 වසරේ සැප්තැම්බර් මස කාර්යසාධනය හා සමඟ සැසඳීගම් දී සමස්ත කොටස් මිල දර්ශකය ඒකක 11,855 සිට ඒකක 21,779දක්වා ඓතිහාසික වර්ධනයක් කෙරේ.
- වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය රුපියල් ට්‍රිලියන 4.4 සිට රුපියල් ට්‍රිලියන 7.8 වර්ධනය වී. විදේශීය මිලදී ගැනීම් රුපියල් බිලියන 37 සිට රුපියල් බිලියන 47 දක්වා වැඩි විණි. 2025 තෙවන කාර්තුවේදී **ආර්ථික වර්ධනය** 5.4%ක ධනාත්මක වර්ධනයක් වාර්තා කරමින් ආර්ථිකය ශක්තිමත් මාවතකට අවතීර්ණ වී ඇති බව තහවුරු කර ඇත.

➢ අභියෝග

- රජයේ ආදායම් වියදම් එනම් අය වැය හිඟය වැඩි වීම.
- රාජ්‍ය මූල්‍ය ස්ථාවරත්වය පිලිබඳ තුලනය
- රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කරණය කිරීම
- රාජ්‍ය බදු ඉහළ දැමීම නිසා ජනතාව වෙත බදු බර වැඩි වීම.
- ආදායම් බෙදීයාමේ විෂමතාව
- රාජ්‍ය සේවක වැටුප් වැඩි කිරීම.
- ආර්ථික දුෂ්කරතාවයට ලක් වූ ජනතාව සඳහා සහන ලබා දීම.
- අඛණ්ඩ හා ගුණාත්මක සෞඛ්‍ය සේවයක් තහවුරු කිරීම සඳහා මූල්‍ය පහසුකම් සම්පාදනය කිරීම.

➢ ඉදිරි ඉලක්ක

ඉහත දක්වා ඇති ප්‍රතිපත්තිමය තීරණ මත පදනම්ව 2025 වසරේදී අවශ්‍ය උපායමාර්ග 2026 වසරේදී තවදුරටත් සිදුකරමින් ස්ථාවර ආර්ථික තත්වයක් කරා ශ්‍රී ලංකාව මෙහෙයවීම ප්‍රධාන ඉලක්කය වේ.

2025 වර්ෂය සඳහා සියයට 5 ක පමණ ආර්ථික වර්ධනයක් අපේක්ෂා කෙරෙන අතර විදේශ හා රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක ශක්තිමත් කිරීමට, අපනයන වර්ධනය සහ විදේශ ආයෝජන වැනි ණය වර්ධනය නොවන ලැබීම් වැඩි දියුණු කිරීමට සහ දිගු කාලීන මූල්‍ය ස්ථායීතාවය ආරක්ෂා වන ලෙස අනාගතයේ දී ණය ආපසු ගෙවීම ක්‍රමවත්ව නැවත ආරම්භ කිරීමට මෙම රාජ්‍ය මූල්‍ය අවකාශය ප්‍රයෝජනයට ගැනීම **ඉලක්කයයි** .

එසේම 2024 වසරේ පළමු කාර්තුවේ සිට අඛණ්ඩව ආර්ථිකයේ සංකෝචනය වීම් වාර්තා කිරීමෙන් අනතුරුව, 2025 වසරේ තුන්වන කාර්තුවේදී ශ්‍රී ලංකා ආර්ථිකය ධනාත්මක ආර්ථික වර්ධනයක් වාර්තා කර ඇත. 2025 වසරේ අවසාන කාර්තුව තුළ භූගෝලීය අභියෝග වලට මුහුණ දුන්න ද, ආර්ථික ක්‍රියාකාරකම් වේගයෙන් අඛණ්ඩව වර්ධනය කරගැනීමටත්, දේශපාලන සථාවර භාවය පවත්වා ගැනීමටත් හැකි වීම ජයග්‍රහණයකි. එසේම, 2025 වසරේ අග භාගයේදී ගන්නා ලද උපායමාර්ග 2026 වසරේදී වාර්ෂික ආර්ථික වර්ධනය ධනාත්මක කිරීමට ඉවහල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වියදම් වලින් හොඳම සමාජ ප්‍රතිලාභය ලබා ගැනීම සහතික වන ලෙස සීමිත බදු අරමුදල් ප්‍රවේශම්සහගත ලෙස කළමනාකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ. 2025 වසරේදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව අංශය ශක්තිමත් කිරීම, පොදු ප්‍රවාහනය, ග්‍රාමීය සංවර්ධනය හා සවිබල ගැන්වීම, කෘෂිකර්මික පුනජීවනය, දේශීය ව්‍යවසායකත්වය, පර්යේෂණ දිරිගැන්වීම සහ දේශීය හා අපනයන-අභිමුඛ කර්මාන්තවල වර්ධනයට හා කාර්යක්ෂමතාවයට ඇති බාධාවන් ඉවත් කිරීම සඳහා කටයුතු කිරීමට අපේක්ෂිතය.

මේ අනුව රජයේ සේවය ප්‍රතිව්‍යුහගතකරණය, සේවක සංඛ්‍යාව පිළිගත් නිර්නායක මත පදනම්ව කළමනාකරණය කිරීම, සුබසාධක වැඩසටහන් මඟින් තෝරාගත් පිරිස් සඳහා 2025 වසරේ සිට පවත්වාගෙන යනු ලබන වැඩසටහන් තවදුරටත් ක්‍රියාත්මක කිරීම, හා අනෙකුත් ආර්ථික උපායමාර්ග තුළින් ආර්ථික ස්වාධීනත්වයට ළඟාවීම ඉලක්ක කර අවශ්‍ය පියවර ගැනීමට සැලසුම් කර ඇත.

ප්‍රාථමික වියදම් සියයට 13 ක සීමාව තුළ පවත්වා ගනිමින් වඩාත් අවධානමට ලක්විය හැකි පුද්ගලයින් සඳහා සමාජ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීම හා අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය රජ්‍ය ආයෝජන දළ දේශීය නිෂ්පාදනයෙන් අවම වශයෙන් සියයට 4 ක පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ. එසේම, අස්ථාවරත්වය වෙනුවට පුරෝකථනය කිරීමේ හැකියාවෙන් ද, වරප්‍රසාද වෙනුවට සාධාරණත්වයෙන් ද, කෙටිකාලීන වාසි වෙනුවට දිගුකාලීන සමෘද්ධියෙන් ද, ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය උපාය මාර්ගය යොදා ගන්නා අතර සැමට සෙවරි, සමෘද්ධිමත් සහ යහපත් ශ්‍රී ලාංකාවක් ගොඩනැඟීම රජයේ මූලික අපේක්ෂාව වේ.

ලේකම්,

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,
ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ - 01

03 පරිච්ඡේදය - 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එ(අ)

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	සතය 2025 රු.	සතය 2024 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	ඒසීඒ-1
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		208,685,625,870	164,337,862,000	ඒසීඒ-3
-	තැන්පතු		1,506,587,711	2,606,610,436	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම		37,726,999	31,887,568	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		210,229,940,580	166,976,360,004	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		210,229,940,580	166,976,360,004	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		1,177,907,477	4,485,632,599	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		209,052,033,103	162,490,727,405	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
482,110,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	424,850,271	436,015,542	ඒසීඒ-2(ii)
9,166,371,489	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	8,605,601,251	3,825,301,951	ඒසීඒ-2(ii)
238,942,898,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	238,214,330,568	186,628,710,063	ඒසීඒ-2(ii)
-	පොලී ගෙවීම්	8	-	-	ඒසීඒ-2(ii)
1,338,511	වෙනත් පුනරාවර්තන වියදම්	9	1,338,511	843,133	ඒසීඒ-2(ii)
248,592,718,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		247,246,120,602	190,890,870,689	
	මූලධන වියදම්				
145,200,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	10	25,784,403	13,071,991	ඒසීඒ-2(ii)
1,209,800,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	892,009,089	8,782,383	ඒසීඒ-2(ii)
47,500,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	9,825,000	10,285,976	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	ඒසීඒ-2(ii)
28,000,000	හැකියා වර්ධනය	14	3,458,286	10,682,065	ඒසීඒ-2(ii)
12,851,000,000	වෙනත් මූලධන වියදම්	15	10,516,625,348	30,613,595,447	ඒසීඒ-2(ii)
14,281,500,000	මුළු මූලධන වියදම් (උ)		11,446,697,126	30,656,417,862	
	තැන්පතු ගෙවීම්		1,318,986,446	3,030,965,610	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		35,768,971	31,516,648	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		1,354,755,417	3,062,482,258	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		260,047,573,145	224,609,770,809	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(50,995,540,042)	(62,119,043,404)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(50,995,540,042)	(62,119,043,404)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ-3
			(50,995,540,042)	(62,119,043,404)	

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඊසිඒ-8

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තක්‍ය 2025 රු.	2024 රු.
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපළ, පිරියත හා උපකරණ	ඊසිඒ-6	14,439,655,868	14,423,181,248
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඊසිඒ-5	61,616,531	63,574,559
මුදල් හා මුදල් සමාන දෑ	ඊසිඒ-3	-	-
මුළු වත්කම්		14,501,272,399	14,486,755,807
<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(335,716,863)	(146,157,570)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		14,439,655,868	14,423,181,248
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඊසිඒ-5(ii)	-	-
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඊසිඒ-4	397,333,394	209,732,129
අග්‍රිම ශේෂය	ඊසිඒ-3	-	-
මුළු වගකීම්		14,501,272,399	14,486,755,807

පිටු අංක 06 සිට 51 දක්වා ඊසිඒ 2 සිට ඊසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 52 සිට 92 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරි
නම : ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම	නම : ඩී.එච්.එස්.පුල්ලෙපෙරුම	නම : ඊ.එම්.යූ.එස්.ඒකනායක
තනතුර :	තනතුර : අතිරේක ලේකම්	
දිනය : 26/02/2026	දිනය : 2026 . 02 . 25	දිනය : 2026-02-2
ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් මුදල් අමාත්‍යාංශය කොළඹ - 01	ඩී.එච්.එස්. පුල්ලෙපෙරුම අතිරේක ලේකම් මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය	ඊ.එම්.යූ.එස්. ඒකනායක ප්‍රධාන ගණකාධිකාරි මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන 2025 රු.	2024 රු.
<u>**මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	85,859,292
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	153,028,795	-
අග්‍රිම ලැබීම්	208,685,625,870	164,337,862,000
අත්තිකාරම් අයකර ගැනීම්	36,187,423	31,013,493
තැන්පතු ලැබීම්	1,506,587,711	2,606,610,436
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**210,381,429,799**	**167,061,345,222**
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	9,014,799,731	4,258,085,169
සහනාධාර සහ මාරුකිරීම්	197,579,303,636	154,686,962,673
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරු කිරීම, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	1,135,689,845	559,545,325
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	2,405,533	1,368,984
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	1,177,907,478	4,485,632,599
අත්තිකාරම් ගෙවීම්	35,576,703	30,002,478
තැන්පතු ගෙවීම්	1,318,986,446	3,030,965,610
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**210,264,669,372**	**167,052,562,839**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**116,760,427**	**8,782,383**
<u>**ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
තිබිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම	116,760,427	8,782,383
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**116,760,427**	**8,782,383**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(116,760,427)**	**(8,782,383)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
<u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

01. පිළියෙල කිරීමේ අරමුණ

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

02. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

03. මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

04. ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

05. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

06. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

07. මුදල් හා මුදල් සමාන දෑ

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

- යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකිරීමේ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

- තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
	අදාල නොවේ				

3.5.1 බදු අභියාචනා කොමිෂන් සභාව විසින් නඩු විමසීම් සිදු කිරීමෙන් රජයට උපයා දී ඇති බදු ආදායම් පිළිබඳ තොරතුරු

වර්ෂය	නඩු සංඛ්‍යාව	නඩු නියෝග අනුව රජයට ලබාදුන් බදු ආදායම් ප්‍රමාණය (රු.)	
		දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (25%)	මුදල් අමාත්‍යාංශය (10%)
2022	174	519,362,707	68,814,911
2023	343	2,808,304,990	158,333,005
2024	136	2,498,114,360	271,568,425
2025	342	984,297,460 ** 256,584,058 ***	23,583,324
එකතුව	**995**	**7,066,663,575**	**522,299,665**

** දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (25%)

*** දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (10%)

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය (රු.)	අවසාන ප්‍රතිපාදනය (රු.)		
පුනරාවර්තන	248,705,718,000.00	248,592,718,000.00	247,246,120,601.00	99%
ප්‍රාග්ධන	14,001,500,000.00	14,281,500,000.00	11,446,697,126.00	80%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන (රු.)		තත්‍ය වියදම (රු.)	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	ජනාධිපති කාර්යාලය	ජනාධිපති උපදේශක, දුමින්ද කේ හුලංගමුව මහතාගේ ගුවන් ටිකට්පත් සඳහා වන වියදම පියවීම.	411,500.00	411,500.00	411,500.00	100%
2	මැතිවරණ කොමිෂන් සභාව	2024 ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මහ මැතිවරණය සහ 2025 පැවති පළාත් පාලන මැතිවරණය වෙනුවෙන් සිදුකල මැතිවරණ රාජකාරී සඳහා දීමනා ගෙවීම	1,611,704.00	1,611,704.00	1,611,704.00	100%
3	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	ණය ශේෂ නිරවුල් කිරීම සඳහා	382,329.00	382,329.00	382,329.00	100%
		වී නවරාජා මයා	115,000.00	115,000.00	115,000.00	
		ඩී.ඩබ්.එස්.රම්‍යවංශ මයා	145,922.00	145,922.00	145,922.00	
		එච්.වී.සී.කුමාර මයා	121,407.00	121,407.00	121,407.00	

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2025 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	3,756,391,027.70	-	
9152	යන්ත්‍රෝපකරණ	-	2,242,188,708.22	-	
9153	ඉඩම්	-	8,389,900,000.00	-	
9154	අස්පෘශ්‍ය වත්කම්	-	51,176,132.08	-	
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම - 01 ලෙස ඉදිරිපත් කර ඇත.

04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම		
	100%- 90%	75%-89%	50%- 74%
සැලසුම් කළ දේශීය පුහුණු අවස්ථා සංඛ්‍යාව		√	
ලැබුණු විදේශීය පුහුණු අවස්ථා සංඛ්‍යාව	√		
ලැබුණු විදේශීය නිවාඩු අයදුම්පත් සංඛ්‍යාව	√		
රාජ්‍ය සේවා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කළ විදේශීය නිවාඩු අයදුම්පත් සංඛ්‍යාව	√		
පත් කළ භාණ්ඩාගාර නියෝජිතයන් සංඛ්‍යාව	√		
ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකා සංඛ්‍යාව	√		

- රාජ්‍ය ව්‍යවසායන් සම්බන්ධයෙන් රජයේ ගිණුම් කටයුතු විධිමත් පරිදි පවත්වා ගැනීම, මූල්‍ය මෙහෙයුම් කටයුතු අධීක්ෂණයට පියවර ගැනීම, එම ආයතන සම්බන්ධව සේවක බඳවා ගැනීම් ආදී කටයුතු සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.

- රේඛීය අමාත්‍යාංශය ලෙස රාජ්‍ය ව්‍යාවසායන්හි සමස්ථ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අවශ්‍ය මගපෙන්වීම සිදු කිරීම හා අධීක්ෂණය අදාළ කාලසීමාවන්හිදී සිදු කර ඇත.

- මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතින ව්‍යවසායන්හි මූල්‍ය ප්‍රගතිය සහ භෞතික ප්‍රගතිය පිළිබඳ ප්‍රශස්ථ කාර්යසාධනය සහතික කිරීම සිදු කර ඇති අතර අදාළ කෝප් කමිටු රැස්වීම් සඳහා සහභාගී වීමෙන් අනතුරුව පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම සහ පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරකසභාවේ රැස්වීම් සඳහා සහභාගී වීම සිදු කර ඇත. රාජ්‍ය ව්‍යවසායන්හි වාර්ෂික වාර්තා මේ වන විටද ලැබෙමින් පවතින අතර ලැබී ඇති සියළු වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත.

- මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතින ප්‍රසම්පාදන කමිටු පත් කිරීම සඳහා නිර්දේශ ලබා දීම, කමිටු සඳහා අමාත්‍යාංශ නියෝජිතයින් පත් කිරීම නිසි කාලය තුළ දී සිදු කරන ලදී.

- මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්හි මූල්‍ය ප්‍රගතිය සහ භෞතික ප්‍රගතිය පිළිබඳ අධීක්ෂණය කර අදාළ වාර්තා කාර්තුමය වශයෙන් ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සිදු කර ඇත. මෙම තොරතුරු ඇතුලත් වාර්තා එම දෙපාර්තමේන්තු මගින් අමාත්‍ය මණ්ඩලය වෙත කාර්තුමය ප්‍රගතිය වශයෙන් ඉදිරිපත් කරනු ලැබේ.

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය- 2025

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ජාතික තිරසර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීම සඳහා විශේෂ දායකත්වයක් දක්වයි. ශ්‍රී ලංකාව විසින් තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා රාජ්‍ය වියදම්වල උපරිම දායකත්වය සහතික කිරීම මෙන්ම එක් එක් තිරසර සංවර්ධන දර්ශක අනුව එම රාජ්‍ය වියදම් වෙන් වන ආකාරය අයවැය සකස් කිරීමේදීම හඳුනාගැනීමට කටයුතු කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය, පහසුකම් සැලසීම, අධීක්ෂණය, ඇගයීම සහ වාර්තා කිරීම සඳහා වන ප්‍රධාන රාජ්‍ය ආයතනය ලෙස, ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන කවුන්සිලය 2018 දී පිහිටුවන ලද අතර, ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන කවුන්සිලය මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය විෂය පථයට අයත් ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ.

තවද, ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ විවිධ රජයේ ආයතන සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය උපදේශකත්වය මෙම අමාත්‍යාංශයේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් සිදුකරන අතර තිරසර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීමේ ප්‍රගතිය පිළිබඳ විද්‍යානුකූල දත්ත සකස් කිරීමේ කාර්යය සඳහා මෙම අමාත්‍යාංශයේ ජනලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙලාර්තමේන්තුය දායකත්වය ලබා දෙයි. එමෙන්ම, ජාතික තිරසර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීම සඳහා සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ තාක්ෂණික සහ මූල්‍යමය දායකත්වය ලබා ගැනීමට මෙම අමාත්‍යාංශය මගින් කටයුතු කරයි.

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු.

තිරසර සංවර්ධනයේදී මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අදාළව තිරසර සංවර්ධන අරමුණු වෙනම හඳුනාගැනීමක් සිදුකරනු නොලැබේ. ඒ අනුව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා භාණ්ඩාගාරයට අයත් විවිධ දෙපාර්තමේන්තු මගින්, ජාතික වශයෙන් තිරසර ආර්ථික කළමනාකරණය උදෙසා විශේෂ දෙපාර්තමේන්තු පිහිටුවා ඇති අතර එමගින් ආර්ථික සම්පත් සඳහා සැම දෙනාටම ප්‍රවේශ වීමේ අයිතිය තහවුරු කෙරෙන ප්‍රමුඛතාවයට යටත්ව ඒ ඒ අංශ වලට අදාළ ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම සිදුකරනු ලැබේ. එම ක්‍රියාවලිය තුළට තිරසර සංවර්ධන ඉලක්ක සැපිරීමට අවශ්‍ය පියවරද අන්තර්ගත කර ඇත.

මෙහිදී මූල්‍යමය ප්‍රතිපත්ති හා ප්‍රතිපාදන වෙන් කිරීම, සංවර්ධන ප්‍රතිපත්ති සැලසුම් හා වැඩසටහන් තිරසර සංවර්ධන අරමුණු 17 ට අනුගත වෙමින් සකස් කරනු ලැබේ. එසේම, එක් එක් අමාත්‍යාංශ සහ ආයතන මඟින් සංවර්ධන වැඩසටහන් සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේදී එම ආයතන සඳහා අදාළ වන තිරසර සංවර්ධන අරමුණු ඒ සඳහා අනුගත කරගැනීමට අවශ්‍ය උපදෙස්, මග පෙන්වීම් හා ප්‍රතිපාදන මුදල් අමාත්‍යාංශය මඟින් ලබා දේ.

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග හා ප්‍රගතිය.

2025 වසරේ පැවැති රාජ්‍ය මූල්‍ය දුෂ්කරතාවයන් හේතුවෙන් රජයේ සංවර්ධන ව්‍යාපෘති හා සමාජ සුබසාධන කටයුතු සම්බන්ධ සියළු වැඩසටහන් ප්‍රතිසමාලෝචනයක් සිදු කරන ලදී. එමගින් අත්‍යාවශ්‍ය වැඩසටහන් හා ව්‍යාපෘති වලට අදාළව ප්‍රමුඛතා හඳුනාගත් අතර රාජ්‍ය මූල්‍ය පාලනය සඳහා වියදම් කළමණාකරණ ප්‍රතිපත්තියට මූලිකත්වය ලබා දෙමින් උපාය මාර්ගික සංවර්ධන කටයුතු පවත්වා ගැනීමට පියවර ගෙන ඇත.

පැවති ප්‍රායෝගික දුෂ්කර ආර්ථික තත්වය යටතේ සමාජ සාධාරණත්වය තහවුරු කිරීම හා දරිද්‍රතාවය අවම කිරීමටත්, ජනතාවගේ සෞඛ්‍ය හා පෝෂණ තත්වයන් නිසි පරිදි පවත්වා ගැනීම මඟින් යහපත් ජීවන තත්වයක් ලබා දීම සඳහා වැඩසටහන් අඛණ්ඩව පවත්වා ගෙන යාමටත් අවශ්‍ය මූල්‍ය සහාය ලබා දීමට කටයුතු කර ඇත.

➢ තිරසර සංවර්ධන ඉලක්ක (SDG - 1.3) සපුරා ගැනීමේ හි වත්මන් ප්‍රගතිය 2025

දරිද්‍රතාවය තුරන් කිරීමේ තිරසාර සංවර්ධන ඉලක්කය (SDG) සමඟ සමපාත වන පරිදි අවදානමට ලක්විය හැකි ජනගහනයට සහාය වීම සඳහා සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය විසින් 2025 වර්ෂය තුල විශාල කාර්යයභාරයක් සිදුකරන ලදී. මේ සඳහා පවුල් මිලියන 3.69 තොරතුරු ඇතුලත් වූ ඒකාබද්ධ සුබසාධන කළමනාකරණ පද්දතිය (IWMS) නම් වූ මෙම මාර්ගගත සමාජ ආරක්ෂණ ලේඛනයක හරහා සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය විවිධ සමාජ සුභසාධක වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

2025 වර්ෂයේදී , අංක 2429/02 හා 2025/03/24 දරණ ගැසට් නිවේදනය අනුව අස්වැසුම සුභසාධන ප්‍රතිලාභ වැඩසටහන හරහා 2025 දෙසැම්බර් මස වනවිට අන්ත දුප්පත්, දුප්පත් හා අවධානමට ලක්වූ කාණ්යේ ප්‍රතිලාභී පවුල් 1,682,278 සඳහා පමණක් මාසික සුභසාධන ප්‍රතිලාභ දීමනා පිරිනමන ලදී.ඒ අනුව සුදුසුකම් ලත් ප්‍රතිලාභීන්ට අස්වැසුම ප්‍රතිලාභය වශයෙන් 2025 වර්ෂය තුලදී රුපියල් බිලියන 159.846 කට අසන්න මුදලක් ඔවුන්ගේ බැංකු ගිණුම් වලට බැර කිරීම සිදුකරනු ලදී.

එසේම ඉහත ගැසට් නිවේදනයේ දෙවන උපලේඛනය අනුව මේ වනවිට අඩු අදායම්ලාභී ආබාධිත පුද්ගලයින්, වකුගඩු රෝගීන් සහ අවු 70 වැඩි වැඩිහිටි පුද්ගලයන් ඇතුළු නිශ්චිත අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා වර්ගීකරණ ගෙවීම් යටතේ 2025 වර්ෂය තුලදී රුපියල් බිලියන 68.62 මූල්‍ය ආධාර ද සපයන ලදී . ඒ අනුව ආබාධිත පුද්ගලයින් 135,375 දෙනෙකු , වකුගඩු රෝගීන් 47,028 දෙනෙකු ,ආයතනගත පුද්ගලයන් 11,621 දෙනෙකු සහ අවු 70 වැඩි වැඩිහිටි පුද්ගලයන් 899,176 දෙනෙකුට මාසිකව සුභසාධන ප්‍රතිලාභ ලබාදීම සිදුකරන ලදී.

තවද සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය මෙම සමාජ ආරක්ෂණ ලේඛනයේ දත්ත සමෘද්ධි සංවර්ධන දෙපාර්තුමේන්තුව විසින් සිදුකරනු ලබන සමාජ සවිබලගැන්වීමේ වැඩසටහන් සඳහා සහ අධ්‍යාපන අමාත්‍යංශය විසින් සිදුකරනු ලබන පාසල් ලිපිද්‍රව්‍ය වැඩසටහන සඳහා ලබා දීම 2025 වර්ෂයේදී සිදුකරනු ලැබූ අතර හදිසි ආපදා තත්වවලදී අවධානමට ලක්වූ පුද්ගලයන් හදුනාගෙන ක්ෂණිකව අවශ්‍ය සහය ලබාදීම වැඩසටහනක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමග ආරම්භ කිරීමට මූලික කටයුතු ආරම්භ කර ඇත.ඒ තුලින් රජයේ ආයතන අතර අන්තර් දත්ත හුවමාරුව හරහා රජයේ ඩිජිටල් කරණය වැඩසටහනට අවශ්‍ය සහය ලබාදීම ද සිදුකරනු ලබයි.

➢ තිරසර සංවර්ධන ඉලක්ක SDG 1.3 හි ඉලක්ක ලඟාකරගැනීම

ජාතික තිරසාර සංවර්ධන ඉලක්ක SDG ඉලක්ක 1.3 හි සඳහන් නිර්ණායක වලට අදාල ප්‍රගතිය ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ගෘහ ආදායම් සහ වියදම් සමීක්ෂණය (HIES) පාදක කරගනිමින් ගණනය කරනු ලබයි .ඒ අනුව සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් 2025 වර්ෂයේදී

SDG 1.3.1.a අදාළව පාසල් ළමුන් සඳහා පොත් හා පාසල් උපකරණ මිලදී ගැනීමට අදාලව අස්වැසුම ප්‍රතිලාභී නාමලේඛණ අධ්‍යාපන අමාත්‍යංශයට යොමු කරන ලදී.

SDG 1.3.1.c සඳහා අවුරුදු 70 ට වැඩි පුද්ගලයන් 899,176 සඳහා වැඩිහිටි දීමනාව ගෙවීම

SDG 1.b අදාළව සමාජ වැඩසටහන් සඳහා වියදම පහත වගුවේ දක්වා ඇත.

	වැඩසටහන	ප්‍රතිලාභීන් සංඛ්‍යාව (2025 දෙසැ)	වියදම රු.මිලියන
01	අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ ගෙවීම	පවුල් 1,682,278	159,845
02	වැඩිහිටි (අවු 70 වැඩි) පුද්ගලයන් ආයතනගත පුද්ගලයන් සඳහා දීමනාව ගෙවීම	899,176 11,621	47,798
03	ආබාධ සහිත පුද්ගලයන් සඳහා දීමනාව ගෙවීම	135,375	15,620
04	වකුගඩු රෝගීන් සඳහා දීමනාව ගෙවීම	47,028	5,202
05	පාසල් ලිපි ද්‍රව්‍ය වැඩසටහන 2024/2025	සිසුන් මිලියන 1.5 (ආසන්න වශයෙන්)	9,527
	මුළු වියදම		**237,993**

අස්වැසුම ප්‍රතිලාභී පවුල් ගණන

මාසය	අන්ත දුප්පත්	දුප්පත්	අවදානමට ලක්වූ	එකතුව
2025 දෙසැම්බර්	418,242	839,984	424,052	1,682,278

විදේශ ණය මත යැපීම් නතර කිරීමට සිදුවූ තත්වය මත වුවත් දේශීයව පැවති මූල්‍ය අර්බුදය හමුවේ නව සංවර්ධන ව්‍යාපෘති හරහා යටිතල පහසුකම් තවදුරටත් දියුණු කිරීමටත් අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් පවත්වාගෙන යාම හා නඩත්තු කටයුතු පිළිබඳවත් රජය මැදිහත් වූ අතර ජනතාවගේ ජීවන තත්වය පවත්වාගෙන යාමට අනුකූලව වූ ප්‍රධාන තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳව දැඩි අවධානය යොමු කර ලෝක බැංකුවේ හා ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර හා අධීක්ෂණය යටතේ යහපත් ජීවන තත්වයක් ජනතාවට ලබා දීමටත් ආර්ථික දුෂ්කරතා අවම කිරීමටත් හැකිවන පරිදි එම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සක්‍රීයව දායකත්වය ලබාදෙන ලදී.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට අවශ්‍ය සහාය හා කෘෂි කර්මාන්තයට අදාළ සහන ලබා දීමට වෙනත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් ඔවුන් ආරක්ෂා කිරීමට අදාළ කටයුතු සිදු කරන ලද අතර මේ පිළිබඳව සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය හා අනෙකුත් වානිජ බැංකු සම්බන්ධ කරගනිමින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කර සමාජ ආර්ථික තත්වය පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ප්‍රමුඛ අරමුණු වන්නේ තිරසර සංවර්ධන ඉලක්ක මත පදනම්ව ආර්ථික සංවර්ධනය ඇති කිරීමට ආර්ථික කටයුතු මෙහෙයවීමයි. ඒ අනුව ආර්ථික සංවර්ධනය උදෙසා අමාත්‍යාංශයේ මෙහෙවර තහවුරු කිරීමට අවශ්‍ය වැඩසටහන් හා ව්‍යාපෘති 2025 වසර පුරා අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු ඉටු කරන ලදී.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	45	36	09
තෘතියික	05	04	01
ද්විතීයික	167	150	17
ප්‍රාථමික	135	110	25
එකතුව	352	300	52

6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ආයතනයේ සේවා අවශ්‍යතාවයන් පවතින සේවක සංඛ්‍යාව මගින් කළමනාකරණය කරගන්නා ලදී.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)
Assessing and Managing Debt – Related Fiscal Risks	01	2025.02.06 - 2025.03.01	විදේශීය
IMF SARTTAC Training Course on Nowcasting	01	2025.02.17 - 2025.02.28	විදේශීය
Mid - Career Training programme for Island Service Officers of Sri Lanka under ITEC 2024/2025	01	2025.03.17 - 2025.03.28	විදේශීය
Seminar on Experience Exchange in the field of Economic Development and Poverty Alleviation between china and Sri Lanka, Early March 2025	01	2025.03.21 - 2025.04.06	විදේශීය
5th Annual Forum on Expanding Women's Participation in the Asian & Pacific Economies: Women Entrepreneurs Finance Code in Asia & the Pacific (As a Panelist)	02	2025.03.25 - 2025.03.27	විදේශීය
AIIB Visitors Program 2015	02	2025.04.05 - 2025.04.19	විදේශීය
Strengthening and Integrating Green, Gender and SDG Budgeting in Asia	01	2025.04.08 - 2025.04.11	විදේශීය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)
Management and Evaluation of Credit Risk of SOEs Debt and Guarantees	03	2025.04.14 - 2025.04.18	විදේශීය
Training Programme in "Digitalization" under the NCGG -SLIDA - MoU	01	2025.04.21 - 2025.05.02	විදේශීය
4th International Conference on Financing for Development	01	2025.04.27 - 2025.05.02	විදේශීය
IMF SARTTAC Training on Climate in Macroeconomic Frameworks	03	2025.04.27 - 2025.05.03	විදේශීය
SA 25.15 Climate in Macroeconomic frameworks	01	2025.04.28 - 2025.04.02	විදේශීය
Proposed Study Mission to Malaysia by Senior Treasury Officials from the Government of Sri Lanka	01	2025.05.12 - 2025.05.16	විදේශීය
Navigation Cross – Boarder NPL Investments & Personal NPL Resolution	01	2025.05.13 - 2025.05.15	විදේශීය
Conference on Public Debt Transparency: Aligning the law with Good Practices	01	2025.05.14 - 2025.05.15	විදේශීය
Seminar on Reform & Governance of State-owned Enterprises for BRI Countries Project Profile	01	2025.05.19 - 2025.06.11	විදේශීය
2025 Asian Regional Public Debt Management Forum in Siem Reap	03	2025.05.20 - 2025.05.22	විදේශීය
Capacity Building Programme on Digital Governance for the Civil Servants of Sri Lanka	01	2025.05.26 - 2025.06.06	විදේශීය
Capacity Building Programme on Digital Governance for the Civil Servants of Sri Lanka	01	2025.05.26 - 2025.06.06	විදේශීය
Seminar for China & B & R Countries in Cooperation of Governance Capacity	01	2025.06.12 - 2025.07.02	විදේශීය
Promoting Private Sector Investment in Energy Transition Knowledge Sharing Program on Republic of Korea's Experiences on Green Energy Transition	01	2025.06.15 - 2025.06.21	විදේශීය
0616- 0629 Seminar on Cyber security under the Global Security Initiative	01	2025.06.16 - 2025.06.29	විදේශීය
Policy and Practice of Poverty Alleviation through Photovoltaic Projects for Developing Countries	01	2025.06.25 - 2025.07.15	විදේශීය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	වැඩසටනේ ස්වභාවය (දේශීය/ විදේශීය)
Seminar on Capacity Building in Proverty Reduction of Small and Medium Enterprises and NGOs for Developing Developing Countries	01	2025.06.27 - 2024.07.10	විදේශීය
4th International Conference on Financing for Development	02	2025.06.30 - 2025.07.05	විදේශීය
Study Tour on Climate Adaptation and Provincial Governance	01	2025.08.25 - 2025.08.30	විදේශීය
"ST 25.19 - Fiscal Rules and Frameworks"	01	2025.08.25 -2025.08.29	විදේශීය
Regional Dialogue and knowledge Exchange on Climate Finance in Asia Pacific	02	2025.08.26 - 2025.08.28	විදේශීය
Twentieth Policy Consultation Forum of Seoul Initiative Network on Green Growth and Asia – Pacific NDC Clinic and SINGG Forum	01	2025.09.08 - 2025.09.11	විදේශීය
5th Capacity Building Programme on "Clean Cities, Better Futures: Transformation Urban Sri Lanka with Regional Practices" for the Civil Servants of Sri Lanka	01	2025.09.15 - 2025.09.26	විදේශීය
Workshop on" Nutrition Budget Tragging and Tracking	01	2025.09.16 - 2025.09.19	විදේශීය
South Asia Operations Forum 2025	01	2025.09.21 - 2025.09.25	විදේශීය
ADB-OECD Meeting on Healthy Ageing and long-term Care (LTC)	01	2025.09.22 - 2025.09.25	විදේශීය
Customs Administration (A) under JICA Knowledge Co-Creation Program	01	2025.10.04 - 2025.11.03	විදේශීය

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්	-		
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන තිබීම.	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාල නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාල නොවේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාල නොවේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. TPD/B/MOF/25/FA | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2026 ජුනි 22 දින

ඇමුණුම - 01

இணைப்பு - 01

Annexure - 01

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ශීර්ෂය 102 - මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 102 - මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු

ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාල විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

අමාත්‍යාංශයේ පැරණි හා නව ගොඩනැගිලිවලට අදාළ විදුලි බිල්පත් සම්බන්ධයෙන් අංක 0470006072 දරන ගිණුමෙහි 2015 වර්ෂයේ දී රු.9,700,000 ක් හා අංක 0470000112 දරන ගිණුමෙහි 1999, 2014 හා 2015 යන වර්ෂවලදී රු.3,500,000 ක් ලංකා විදුලි බල මණ්ඩලයේ ආරක්ෂණ තැන්පතු ලෙස තබා තිබුණි. මේ සම්බන්ධයෙන් 2025 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශනයෙහි (ඒසිඒ-5) වෙනත් අත්තිකාරම් යටතේ හෙළිදරව් කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි මූල්‍ය වත්කම් යටතේ ඉහත සඳහන් තැන්පතු ගිණුම්වල එකතුව වූ රු.13,200,000 ක අත්තිකාරම් ගිණුමේ ශේෂය අඩුවෙන්ද, ශුද්ධ වත්කම් හා ස්කන්ධය යටතේ භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් ද එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය

ස්ථාවර වත්කම් ලේඛනය හා විගණනයට ලබා දුන් තහවුරු කිරීම් අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වාහන වල වටිනාකම රු.638,870,000ක් වුවද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට අනුව එය රු.1,832,801,693ක් වශයෙන් රු.1,193,931,693ක් අඩුවෙන් දක්වා තිබුණි. එසේ වුවද ස්ථාවර වත්කම් ලේඛනයේ වාහන 32 ක වටිනාකම ශුන්‍ය ලෙස දක්වා තිබුණි.

1.6.3 ලේඛන සහ පොත්පත් පවත්වා නොතිබීම

(අ) බැරකම් ලේඛනය

මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව, මුදල් තිබෙන බවටත්, නිතිපතා බිල් ලැබෙන බවටත්, එම බිල් අප්‍රමාදව බේරුම් කරන බවටත් සහතික වීම පිණිස බලය දෙන නිලධාරීන් මෙන්ම සහතික කරන නිලධාරීන් ද විසින් බැරකම් පිළිබඳ ලේඛන නිතිපතා පරීක්ෂා කල හැකිවන පරිදි බැඳීම් හා බැරකම් ලේඛනයක සටහන් කල යුතු වුවත්, 2025 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 25,805,493 ක් වූ බැඳීම් හා බැරකම් සම්බන්ධයෙන් බැරකම් ලේඛනයක සටහන් කර නොතිබුණු අතර එම බැඳීම් හා බැරකම් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් **SA** 92 අනුව ද වාර්තා කර නොතිබුණි.

(ආ) හානි පිළිබඳ ලේඛනය

මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව, හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගත යුතු වුවද අමාත්‍යාංශය විසින් හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණු අතර 2025 වර්ෂය තුල සිදු වූ වාහන අනතුරු 21ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනය සමඟ ඉදිරිපත් කර තිබූ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයෙහි (ඇමුණුම (i)) හෙළිදරව් කර නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන වැය විෂයයකට හා මූලධන වැය විෂයයන් 4කට වෙන් කරන ලද රු. 4,850,000 ක් වූ මුළු ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයම උපයෝජනය කිරීමකින් තොරව ඉතිරි වී තිබුණි.

3.2 රාජ්‍ය ආයතන වෙත වියදම් දැරීම සඳහා වෙන් කර දෙන ලද ප්‍රතිපාදන උපයෝජනයේ ප්‍රගතිය

තිරසර සංවර්ධන සභාව හා බදු අභියාචනා කොමිෂන් සභාව යන රාජ්‍ය ආයතනවල වැය විෂයයන් 07 ක් වෙනුවෙන් වියදම් දැරීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් වෙන්කර තිබූ එකතුව රු.10,420,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.6,923,253 ක් උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම් වැය විෂයයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 49 සිට සියයට 97 දක්වා සැලකිය යුතු පරාසයක් ගෙන තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 ක්‍රියාකාරී සැලැස්ම හා එහි ප්‍රගතිය

(අ) 2025 වර්ෂය සඳහා අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතාව අනුව පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම තුල එක් එක් ක්‍රියාකාරකම්වලට අදාලව ක්‍රියාත්මක කාල රාමුව (Time Line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමැවුම (Out Put), අපේක්ෂිත ප්‍රතිඵලය (Out Come) භෞතික හා මූල්‍ය වශයෙන් දක්වා නොතිබූ අතර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ අපේක්ෂිත නිමවුම / ප්‍රතිඵලය ඇතුලත් කර නොතිබීමත් ප්‍රගතිය සඳහන් කිරීමේ දී ක්‍රියාකාරකම් කිහිපයක එකතුවක් සඳහා ප්‍රගතිය සඳහන් කර තිබීම නිසා එක් එක් ක්‍රියාකාරකම සඳහා වෙන වෙනම ප්‍රගතිය මැන බැලීම ගැටළු සහගත විය.

(ආ) අමාත්‍යාංශය යටතේ පවත්නා රජයට අයත් ව්‍යාපාර, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය ව්‍යාපාරවලට අදාළ වාර්ෂික අයවැය ලේඛන, ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික ගිණුම නිසි ලෙස ඉදිරිපත් කිරීම හා සහතික කිරීම පිළිබඳ අධීක්ෂණය, ආයතනික කටයුතු අංශයේ ක්‍රියාකාරකම් ලෙස ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා තිබුණද, අමාත්‍යාංශය එම වාර්තා කිරීම සම්බන්ධයෙන් විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබූ බැවින්, අමාත්‍යාංශය විසින් ඒ පිළිබඳව විධිමත් පසුවිපරමක් සිදු කරන්නේ ද යන්න පරීක්ෂා කිරීමට නොහැකි විය.

4.1.2 ව්‍යාපෘති ඉටු නොකිරීම

2024 වර්ෂයේ ආරම්භ කර තිබූ "ආයෝජන හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම" යන ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය තුළ අංක "102-02-08-003-2509 - වෙනත්" දරන වැය විෂයය යටතේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් රු.100,000,000ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණද, ව්‍යාපෘතියේ අදාළ කාර්යයන් ඉටු නොකිරීම හේතුවෙන් සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

4.1.3 රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණ ඒකකය සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ ඒකකය

රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගතකරණය කිරීමට අදාළව "රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගතකරණ ඒකකයක්" පිහිටුවා 2022 දෙසැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වී තිබුණි. 2023 මැයි 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ලැයිස්තුගත කර තිබූ ආයතන 72 ක් අනුබද්ධිත සමාගම් ලෙස ප්‍රතිව්‍යුහගතකරණය සඳහා වූ පාලක සමාගමක් (HOCO) 2026 මැයි 20 දින දක්වාත් ස්ථාපිත කර නොතිබුණි. එසේ වුවද, එම පාලක සමාගම වෙත පවරාගෙන ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජනා වී තිබූ ලැයිස්තුගත ආයතන 08 ක් පාලක සමාගම වෙත පවරා ගැනීමකින් තොරව ප්‍රතිව්‍යුහගතකරණය යටතේ බැහැර කිරීම් (Divesting) ක්‍රියාවලිය සඳහා ගනුදෙනු උපදේශකවරුන් තෝරාගෙන තිබුණි. එසේම, තෝරාගත් ආයතන 08න් ආයතන 07ක් සඳහා ගණුදෙනු උපදේශකවරු පත්කිරීම සඳහා 2023 වර්ෂයේදී අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබා දී තිබූ අතර ගණුදෙනු උපදේශකවරුන් වශයෙන් ගිවිසුම්ගත වූ විදේශීය ආයතන දෙක සඳහා 2024 වර්ෂයේදී මුදල් අමාත්‍යාංශයේ අංක 18/62P දරන පොදු තැන්පත් ගිණුම මගින් රු. මිලියන 193 ක් ගෙවා තිබුණි. 2024 දෙසැම්බර් 31 දින වන විටත් "රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණ ඒකකය" පිහිටුවීමේ අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වූ බැවින් රාජ්‍ය ව්‍යවසායන් සඳහා ප්‍රතිසංස්කරණ උපාය මාර්ග සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම සම්බන්ධීකරණ ආයතනයක් ලෙස ක්‍රියා කිරීමේ අරමුණින්, 2025 නොවැම්බර් 04 දිනැති අංක අමප/25/2028/804/242 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ "රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ ඒකකය" යන නමින් නව ඒකකයක් පිහිටුවා තිබුණි. එමෙන්ම, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද ක්‍රියා නොකරන රාජ්‍ය ව්‍යවසායන් වසා දැමීම සඳහා ඈවර කරන්නන් පත් කිරීම සම්බන්ධ 2025 අගෝස්තු 24 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 25/1570/804/185 මත පදනම්ව, 2025 සැප්තැම්බර් 03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී රාජ්‍ය ව්‍යවසාය 32 ක් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, එකම කාර්යය වෙනුවෙන් පිහිටුවා තිබූ ඒකකයේ නාමය සමාලෝචිත වර්ෂය තුළ දී වෙනස් කර තිබූ අතර එම ඒකකය පවත්වාගෙන යාම වෙනුවෙන් 2023 වර්ෂයේ සිට 2025 වර්ෂය අවසාන වන විට රු.මිලියන 157.7 ක් හා උපදේශකවරුන්ට රු.මිලියන 193 ක්ද දරා තිබුණද, අපේක්ෂිත කාර්යය 2026 මැයි 20 දින වන විටත් සම්පූර්ණ වී නොතිබුණි.

4.2 වත්කම් කළමනාකරණය

වාහන උපයෝජනය

(අ) මුදල් රෙගුලාසි 104(1) (අ) ප්‍රකාරව පාඩුවක් හෝ අලාභ හානියක් සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමටත් එයට වගකිවයුතු පාර්ශවයන් නිශ්චය කිරීමත් සඳහා පරීක්ෂණ ආරම්භ කල යුතු අතර මු.රෙ 104(3) ප්‍රකාරව පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07කට වැඩි ප්‍රමාදයක් සිදුවන්නේ යැයි

අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාවක් වහාම ඉදිරිපත් කල යුතුය. කෙසේ වෙතත්, 2024 වර්ෂයේ සිදු වූ වාහන අනතුරු 11කට අදාලව 2026 මැයි 20 දින වන විට මාස 10 සිට මාස 26ක කාලයක් ද, 2025 වර්ෂයේ සිදු වූ වාහන අනතුරු 17කට අදාලව මාස 2 සිට මාස 15 දක්වා කාලයක් ගෙන තිබුණ ද ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අලාභහානිය සිදු වූ දිනයේ සිට මාස 03 ක් ඇතුලත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කලයුතු වුවත් 2024 හා 2025 වර්ෂවලදී වාහන 25කට අදාලව අනතුරු සිදු වී 2026 මැයි 20 දින වන විට මාස 05 සිට මාස 26ක කාලයක් ගතවී ඇතත් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

4.3 කළමනාකරණ දුර්වලතා

4.3.1 බදු අභියාචනා කොමිසම් සභාව

(අ) බදු අභියාචනා කොමිසමෙහි අභියාචනා විසඳීමේ ප්‍රගතිය

2025 දෙසැම්බර් 31 දින දක්වා බදු අභියාචනා කොමිසම් සභාවේ ලියාපදිංචි කර ඇති එහෙත් විසඳා අවසන් නොවූ අභියාචනා 626ක් වූ අතර එහි මතභේදකාරී මුළු බදු මුදල් වටිනාකම රු. 108,076,876,883 ක් විය.

(i) ඒ අනුව, 2025 දෙසැම්බර් 31 දින තෙක් විසඳා අවසන් නොවූ එනම් නිශ්චය ලබා නොදුන් අභියාචනා 626 අතරින් අභියාචනා 20ක් රුපියල් බිලියනය ඉක්මවන මතභේදකාරී බදු මුදලකට යටත් වන අතර ඒවායෙහි මුළු මතභේදකාරී වටිනාකම රු.52,052,871,768ක් වන අතර නිශ්චය ලබා නොදුන් මුළු අභියාචනාවලට අදාළ මතභේදකාරී බදු මුදලේ වටිනාකමෙන් සියයට 48ක් විය. ඊට අමතරව, රුපියල් මිලියන 100ත් රු. බිලියන 1 ත් අතර මතභේදකාරී බදු වටිනාකමක් සහිත අභියාචනා 133ක් සඳහා නිශ්චය ලබා දී නොමැති අතර එහි මතභේදකාරී මුළු බදු වටිනාකම රු.46,597,054,584ක් හා එය නිශ්චය ලබා නොදුන් මුළු අභියාචනාවලට අදාළ මතභේදකාරී බදු මුදලේ වටිනාකමෙන් සියයට 43ක් විය.

(ii) තව ද 2011 වර්ෂයේ සිට 2026 අප්‍රේල් 24 දක්වා කාල සීමාවට අදාළව බදු අභියාචනා කොමිෂන් සභාවෙහි ලියාපදිංචි වී ඇති සහ විභාග කිරීම් ආරම්භ කර ඇතත් තවදුරටත් නිශ්චයන් ලබා දී නොමැති අභියාචනා 611ක් නිරීක්ෂණය වූ අතර ඊට අදාළ මතභේදකාරී බදු මුදලෙහි වටිනාකම රු. 107,206,035,953 ක් විය.

(iii) අභියාචනා විභාග කිරීම අවසන් වුවත්, අවසන් නිශ්චය ලබා දී නොමැති 2025 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ වූ "Reserved Cases" 146ක් පවතින අතර ඊට අදාළ මතභේදකාරී බදු මුදලෙහි වටිනාකම රු.34,101,648,306ක් විය. මෙසේ අභියාචනා විසඳීමේ ක්‍රියාවලියේ අවසන් අදියරේ දී කටයුතු නිම නොකර ඊට අදාළව දීර්ඝ කාලයක් ගත කර තිබීම අපේක්ෂිත කාර්යසාධන මට්ටම ලගා නොවීමක් විය.

(iv) තවද 2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභා පනතෙහි 10 වන වගන්තිය අනුව, බදු අභියාචනාවක් විභාග කිරීම ආරම්භ කල දින සිට දින 270ක් තුළ විසඳා තීරණය ලබා දීම සිදු කළ යුතු අතර එම වගන්තිය විධානාත්මක (Mandatory) වගන්තියක් බවට පත්කිරීමට අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමට බදු අභියාචනා කොමිෂන් සභාව අසමත් වී තිබුණි.

(v) බදු අභියාචනා කොමිෂන් සභාවට දත්ත පද්ධතියක අවශ්‍යතාව සැලකිල්ලට ගෙන 2025 වර්ෂයේ රු. 2,500,000ක මුදලක් හා 2026 වර්ෂයේ රු. 2,000,000ක මුදලක් මෘදුකාංග සංවර්ධනය සඳහා වෙන් කර ඇතත් 2026 මැයි 20 වන විටත් ඊට අදාළව දත්ත පද්ධතියක් සකස් කර අවසන් නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) බදු අභියාචනා කොමිෂන් සභාවට නිලධාරීන් පත් කිරීම

බදු අභියාචනා කොමිෂන් සභාවේ සභාපති ඇතුළු සාමාජිකයන් වසර 03ක ධූර කාලයක් සඳහා පත් කරනු ලබන පසුබිමක අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්වීම් ලිපි නිකුත් කර ඇති ඇතැම් සාමාජිකයන් පත්වීම භාර නොගැනීම සහ ඇතැම් සාමාජිකයන් පත්වීම් ලබා මාස 02කටත් අඩු කාලයකදී ඉල්ලා අස්වී තිබුණි.

තවද, බදු අභියාචනා කොමිෂන් සභාවේ සභාපති ධූරය පුරප්පාඩු වීමත් සමඟ 2025 නොවැම්බර් 03 දිනෙන් අවසන් වූ බදු අභියාචනා විසඳීමේ කමිටු නැවත ආරම්භ කරනු ලැබ ඇත්තේ 2026 ජනවාරි 26 දිනය. එබැවින් බදු අභියාචනා කොමිෂන් සභාව සඳහා සභාපති වරයෙක් පත් කිරීමට මාස 03කට ආසන්න කාලයක් ගත වීම තුළ එම කාල සීමාව තුළ බදු අභියාචනා විසඳීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් අඩපණ වී ඇති බව නිරීක්ෂණය විය.

කොමිෂන් සභාවේ බදු අභියාචනා විසඳීමේ ක්‍රියාවලිය 2025 අගෝස්තු 31 දිනයෙන් අවසන් වුව ද, ඒ සඳහා සභාපති ඇතුළුව නව සාමාජිකන් පත් කිරීමට කාලීනව කටයුතු නොකිරීම නිසාවෙන්, 2025 සැප්තැම්බර් 01 දින සිට සැප්තැම්බර් 23 දින දක්වා සැලසුම් කරන ලද ආයතන 120කට අදාළ වන මතභේදකාරී බදු මුදල වන රු.31,621,736,483 ක බදු අභියාචනා විමසීමේ කටයුතු ප්‍රමාද වීමට ද හේතු වී ඇති බව නිරීක්ෂණය විය. තවද, බදු අභියාචනා විසඳීමේ ක්‍රියාවලිය අක්‍රීය වී පැවති එම කාල සීමාව තුළ ආයතන 13කට අදාළ බදු අභියාචනා 26ක සංඛ්‍යාවක් යොමු කර තිබුණ අතර එහි ප්‍රශ්නගත මුළු බදු වටිනාකම රු.1,868,077,993 බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

4.4 හඳුනාගත් පාඩු

අමාත්‍යාංශයේ පැරණි ගොඩනැගිල්ලට හා නව ගොඩනැගිල්ලට අදාළ විදුලි බිල්පත් ගෙවීම ප්‍රමාදවීම හේතුවෙන් 2024 වර්ෂය වෙනුවෙන් රු 1,347,948ක් ද, 2025 වර්ෂය වෙනුවෙන් රු.1,012,479 ක් ඇතුළුව එකතුව රු.2,360,427 ක දඩ මුදලක් අමාත්‍යාංශය විසින් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවා තිබුණි.

5. යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළදී පුනරාවර්තන වියදම් සඳහා රු.247,246,120,602 ක් ද ප්‍රාග්ධන වියදම් සඳහා රු.11,446,697,126 ක් ද දරා තිබුණි. එම වියදමින් රු.238,317,741,167 ක් හා රු.11,303,392,049 ක් පිළිවෙලින් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් ලෙස වෙනත් ආයතන, ව්‍යාපෘති හා වියදම් ඒකක 13 ක් වෙත ප්‍රතිපාදන නිදහස් කර සිදුකරන ලද වියදම් වේ. එම මුළු පුනරාවර්තන වියදමින් රු.237,993,257,479 හෙවත් සියයට 99 ක් අස්වැසුම වැඩ සටහනේ මුල්‍යාධාර ගෙවීම් බව නිරීක්ෂණය විය. ඒ අනුව අස්වැසුම වැඩ සටහන වැනි සමාජ සුභ සාධන වැඩ සටහන් සඳහා අමාත්‍යාංශය විසින් ඉහළ දායකත්වයක් සපයන බැවින් අඩු ආදායම් ලාභීන්ගේ ජීවන තත්ත්වයන් ක්‍රමයෙන් වර්ධනය කිරීමේ ආදායම් මාර්ගවල සාර්ථකත්වය පිළිබඳව අදාල අමාත්‍යාංශ සමඟ ඇගයීමට ලක් කර තිබූ බවට විගණනයට නිරීක්ෂණය නොවීය.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට අනුමත, තත්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවක වර්ගීකරණය	සේවක සංඛ්‍යාව		
	අනුමත	තත්‍ය	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ මට්ටම	45	36	09
තෘතියික මට්ටම	05	04	01
ද්විතියික මට්ටම	167	154	13
ප්‍රාථමික මට්ටම	135	118	17
එකතුව	**352**	**312**	**40**

2025 දෙසැම්බර් 31 දින වන විට අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 352 න් 40 ක් හෙවත් අනුමත තනතුරු සංඛ්‍යාවෙන් සියයට 11 ක් පුරප්පාඩු වී පැවතිණි. ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 9 ක් ඇතුලත් විය.

එස්. රත්නවීර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට